මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: MOF/NB/013/CM/26/146
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.05.11

## මැද පෙරදිග යුධමය වාතාවරණය හේතුවෙන් සෘජුවම බලපෑමට පත් ජනතාවට සහන සැලසීම

මැද පෙරදිග යුධමය වාතාවරණය හේතුවෙන් සෘජුවම බලපෑමට පත් ජනතාවට සහන සැලසීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන් පහත අමාත්‍ය මණ්ඩල තීරණය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

02. මෙම සහන වැඩසටහනට, අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා එක වරක් පමණක් සිදු කරනු ලබන සෘජු මුදල් ගෙවීම්, ගොවීන් සඳහා පොහොර සහනාධාරයක් ලබා දීම, ඉන්ධන සහනාධාරයක් ලබා දීම සහ විදුලි පාරිභෝගිකයන් සඳහා සහන ලබාදීම ඇතුළත් වේ.

03. යෝජිත පොහොර සහනාධාරය ප්‍රතිලාභීන් වෙත ලබා දීමේ දී, දැනට පොහොර සහනාධාර සලසා දීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුව කටයුතු කරනු ලැබේ. ඒ අනුව, වී වගාකරුවන් සඳහා එක් අයෙකුට උපරිම හෙක්ටයාර 02ක් දක්වා, හෙක්ටයාර 01කට දැනට එක් කන්නයකට ගෙවනු ලබන රු. 25,000/-ක දීමනාව රු. 30,000/-ක් දක්වාත්, කුඹුරුවල වෙනත් ක්ෂේත්‍ර භෝග වගාකරුවන් සඳහා එක් අයෙකුට උපරිම හෙක්ටයාර 02ක් දක්වා, හෙක්ටයාර 01කට දැනට එක් කන්නයකට ගෙවනු ලබන රු. 15,000/-ක දීමනාව රු. 18,000/-ක් දක්වාත් ඉහළ නංවා හිමිගැන්වීමට කටයුතු කරනු ලැබේ.

04. යෝජිත ඉන්ධන සහනාධාරය 2026 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන අතර, සියලුම ඉන්ධන සැපයුම්කරුවන් විසින් සපයනු ලබන 92 ඔක්ටේන් පෙට්‍රල් හා ලංකා ඔටෝ ඩීසල් / ලංකා කාර්මික ඩීසල් ප්‍රමාණය අනුව අදාළ ඉන්ධන සහනාධාරය සලසනු ලැබේ. ඒ අනුව, අප්‍රේල් මාසය සඳහා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම මාසය තුළ අලෙවි කර ඇති 92 ඔක්ටේන් පෙට්‍රල් සහ ලංකා ඔටෝ ඩීසල් / ලංකා කාර්මික ඩීසල් වෙනුවෙන් රු. බිලියන 15ක ඉන්ධන සහනාධාරයක් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත බලශක්ති අමාත්‍යාංශය හරහා ලබා දෙනු ලැබේ. එලෙසින්ම අනෙකුත් ඉන්ධන සැපයුම්කරුවන් විසින් අප්‍රේල් මාසයේ දී සිදු කර ඇති ඉන්ධන අලෙවිය අනුව එම සැපයුම්කරුවන් වෙත ද ඉහත පරිදි ඉන්ධන සහනාධාරය හිමිගන්වනු ලැබේ.

05. විදුලි පාරිභෝගිකයන් වෙත සහන සැලසීමට යෝජිත රු. බිලියන 15ක මූල්‍ය ප්‍රතිපාදන, 2026 මැයි මස ආරම්භයේ දී නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (NSO) වෙත එකවර ලබා දෙනු ලැබේ. ඒ අනුව, උක්ත මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය තුළින් එම සහනය, මසකට විදුලි ඒකක 180කට වඩා අඩු විදුලි පරිභෝජනයක් සහිත විදුලි පාරිභෝගිකයන්ට, හෝටල් (පාරිභෝගික කාණ්ඩ H 1), කර්මාන්ත (පාරිභෝගික කාණ්ඩ I 1) හා ව්‍යාපාර (පාරිභෝගික කාණ්ඩ G 1) වෙත සැලසීමටත්, එම සහනය මීළඟ විදුලි ගාස්තු සංශෝධන චක්‍රයේ ආරම්භක දිනයේ සිට ඉන් අනතුරුව එළැඹෙන විදුලි ගාස්තු සංශෝධන චක්‍රයේ ආරම්භක දිනය දක්වා අදාළ කර ගැනීමටත් කටයුතු කරනු ලැබේ.

06. මෙම සහන වැඩසටහන සඳහා සුදුසුකම් ලැබීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියට යටත්ව, අනුමත වියදම් සීමාව තුළ අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කිරීම් සහ ප්‍රතිපාදන ගැලපීම් හරහා අවශ්‍ය පරිදි රු. බිලියන 100ක් දක්වා උපයෝජනය කිරීමට අපේක්ෂා කෙරෙන අතර සහන වැඩසටහන 2026 සැප්තැම්බර් මස අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර අවසන් කරනු ලැබේ.